# ඓතිහාසික දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර හා බැඳුණු ජන ජීවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එච්.එම්.අයි.එන්. හේරත් [1], කේ.ඒ.ඒ. ඩිල්ශානි [2], පී.ජී.එස්. සෙව්වන්දි [3]*

අනාදිමත් කාලයක සිට සුවහසක් බැතිමතුන්ගේ වන්දනාමානයට පාත්‍රවන ඓතිහාසික වටිනාකමකින් යුතු පුදබිමක් වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ පිහිටි දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය හැඳින්විය හැකිය. දෙවියන් උදෙසා පුදපූජා පැවැත්වීමත්, දේව ආශිර්වාද ලබා ගැනීමත් අරමුණු කරගනිමින් වාර්ෂිකව පැවැත්වෙන උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර සුවිශේෂී වේ. දෙස් විදෙස් අවධානයට ලක්වන දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර හා බැඳුණු ජන ජීවිතය කෙබඳුද? යන ගැටලුව ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කරන ලදී. දෙවිනුවර පෙරහැර හා බැඳුණු ජන ජීවිතයේ ස්වභාවය හඳුනාගැනීම ප්‍රධාන අධ්‍යයන අරමුණයි. ජනතාව සහ පෙරහැර අතර සබඳතාවය හඳුනාගැනීම සහ ජන සමාජයටත්, ආර්ථිකයටත් එහි බලපෑම හඳුනාගැනීම සෙසු අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර දත්ත ඒකරාශී කිරීමේදී පුස්තකාල සමීක්ෂණය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යොදාගන්නට විය. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමය යටතේ දෙවිනුවර ග්‍රාමය යොදාගනිමින් අහඹු නියැඳිය යටතේ පුද්ගලයන් 30 දෙනෙකුගෙන් ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ ව්‍යූහගත නොවන ක්‍රමය ආශ්‍රයෙන් තොරතුරු ඒකරාශී කරන ලදී. රැස් කරගන්නා ලද දත්ත තේමාත්මක, කථනාත්මක සහ ඓතිහාසික ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. ක්‍රි.ව.1257 දී පමණ අරඹන ලද දෙවිනුවර පෙරහැර, ආගමික භක්තිය ඒකරාශී කරවන විශේෂ අවස්ථාවකි. පෙරහැර සඳහා දෙවිනුවර ජනයා අලුත් අවුරුද්දකට මෙන් නිවෙස් අලුත්වැඩියා කරමින් සූදානම් වේ. ආගන්තුක සත්කාර කිරීම අතීතයේ සිටම ප්‍රදේශවාසීන්ගේ සිරිත විය. වයස් භේදයකින් තොරව සියලුදෙනා පෙරහැර කටයුතුවලට දායකවන අතර වීදි අලංකරණය, සැල්වින් සිල්වාගේ කලායතනය ප්‍රධානව නර්තන පුහුණුවීම්, කාවඩි නර්තනයන්ට දෙස්විදෙස් ලාංකිකයන්ගේ සහභාගීත්වය, මූල්‍ය ආධාර, තෙල් සිඳීම ආදිය දැඩි භක්තියකින් සිදුකරන බව හෙළිවිය. පෙරහැර කාලසීමාවේදී යහපත් මෙන්ම අයහපත් සිදුවීම් ජන ජීවිතයට බලපෑම් කරයි. විරසකයන් මුල් කරගනිමින් පළිගැනීම් සඳහා පෙරහැර පැවැත්වෙන කාලසීමාව එනතෙක් බලා සිටීමත්, සිසුන්ගේ පාසල් අධ්‍යාපනයට බාධා වීමත්, අහිතකර සංස්කෘතීන් ආරෝපණය වීමත් මෙන්ම සොරකම් සිදුවීම් යනාදිය ගැටලුකාරී තත්ත්වයන් වේ. පෙරහැර අවසානයේ දින හතක් පුරා පැවැත්වෙන සල්පිළ තුළින් දෙවිනුවර ජනයාට ආර්ථිකයෙන් සමෘද්ධිමත් වීමට අවකාශ සැලසේ. යම් ආකාරයකින් අතීත සිරිත් ගිලිහී ගොස් පැවතිය ද ජනතාව සතු දැඩි ආගමික විශ්වාසවලට අනුව පෙරහැර ආරම්භයේ සිට අවසානය දක්වා වර්තමානයේදීත් කටයුතු කරන බවත්, අතීතයේ සිටම දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර සමඟ ජන ජීවිතයේ සියලු ක්ෂේත්‍ර එකිනෙකට බැඳී පවතින බවත් පැහැදිළි වේ.

***ප්‍රමුඛ පදඃ*** ආගමික භක්තිය, උපුල්වන්, ඓතිහාසික, ජන ජීවිතය, දෙවිනුවර

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ireshahmnilmini1999@gmail.com

[2] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ashinidilshani247@gmail.com

[3] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. saralasewwandi99@gmail.com